“(ස්වර්ගවාසීහු ස්වර්ගයට පිවිසෙන විට) නිවේදකයෙක් "සැබැවින්ම නුඹලාට සුව සැපවත් ජීවිතයක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක රෝගාතුර නොවනු ඇත. තවද සැබැවින්ම නුඹලාට ජීවත්වීමක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක මරණයට පත් නොවනු ඇත. නුඹලාට තරුණකම ඇත. එහෙයින් නුඹලා කිසිවිටෙක මහලු නොවනු ඇත. නුඹලාට භුක්ති විඳීමක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක බලාපොරොත්තු සුන්කර නොගනු ඇත

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ සඊද් අල්-කුද්රි තුමා හා අබූ හුරෙයිරා තුමා (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී: “(ස්වර්ගවාසීහු ස්වර්ගයට පිවිසෙන විට) නිවේදකයෙක් "සැබැවින්ම නුඹලාට සුව සැපවත් ජීවිතයක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක රෝගාතුර නොවනු ඇත. තවද සැබැවින්ම නුඹලාට ජීවත්වීමක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක මරණයට පත් නොවනු ඇත. නුඹලාට තරුණකම ඇත. එහෙයින් නුඹලා කිසිවිටෙක මහලු නොවනු ඇත. නුඹලාට භුක්ති විඳීමක් ඇත. එහෙයින් නුඹලා කිසි විටෙක බලාපොරොත්තු සුන්කර නොගනු ඇත. එය සර්වබලධාරී අල්ලාහ්ගේ ප්රකාශයට
අනුවය. එනම්: "නුඹලාගේ එම ස්වර්ගය නුඹලා උරුම කරගෙන ඇත්තේ නුඹලා සිදුකරමින් සිටි
දෑ හේතුවෙනි යැයි ඔවුන් අමතනු ලබති." (අල්-අඃරාෆ්: 43) [صحيح] [رواه مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ මෙනෙහි කර සිටියහ. "ස්වර්ගවාසීන් ස්වර්ගයේ භුක්ති විඳිමින් සිටිය දී 'සැබැවින්ම ඔබට සුවය ඇත. ස්වර්ගයේ කිසිවිටෙක සුළු රෝගී තත්ත්වයක් හෝ ඔබට හට ගන්නේ නැත. තවද සැබැවින්ම ඔබ ජීවිතය ගත කරනු ඇත. එහි කිසිවිටෙක ඔබ මරණයට පත් වන්නේ නැත. සුළු මරණය හෙවත් නින්දකට හෝ ඔබ වැටෙන්නේ නැත. ඔබ තරුණවියේ පසුවනු ඇත. එහි ඔබ කිසිවිටෙක මහලු වන්නේ නැත. තවද ඔබ එහි භුක්ති විඳිනු ඇත. එහෙයින් ඔබ එහි කිසිවිටෙක දුකට පත්වන්නේ නැති අතර බලාපොරොත්තු සුන් වී යන්නේ නැත. එය සර්ව බලධාරී අල්ලාහ්ගේ ප්රකාශයයි." එනම්: "නුඹලාගේ එම ස්වර්ගය නුඹලා උරුම කරගෙන ඇත්තේ නුඹලා සිදුකරමින් සිටි දෑ හේතුවෙනි යැයි ඔවුන් අමතනු ලබති."

http://www.sunnah.global/hadeeth/si/show/8341